**විදුර විද්‍යාලය - කොළඹ**

**4 වන ශ්‍රේණිය**

**සිංහල භාෂාව**

- **දුවේ පුතේ, පහත සඳහන් ශිෂ්‍ය සටහන් ඔබේ සිංහල ලිවීම පොතට පිටපත් කරන්න.**

## <u>වෙබ් අඩවි තොරතුරු</u>

ශිෂ්‍ය සටහන 01

### පිදුරුතලාගල කන්ද

ශ්‍රී ලංකාවේ පිහිටි කඳු අතරින් උසින් වැඩි ම කන්ද ලෙස සැලකෙන්නේ පිදුරුතලාගල කන්ද යි. එහි උස මුහුදු මට්ටමේ සිට මීටර් 2524කි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටි මෙම කන්දට ගමන් කළ යුත්තේ නුවරඑළිය නගරය හරහා ය. මහවැලි ගඟෙහි අතු ගංගාවක් වන බෙලිහුල් ඔය ආරම්භ වන්නේ ද පිදුරුතලාගල කඳු පන්තිය ආශ්‍රිතව යි. පිදුරුතලාගල කන්ද සමීප වනාන්තරයේ දැකිය හැකි ශාක හා සතුන් අතරින් වැඩි ප්‍රමාණයක් අපේ රටට ආවේණික වෙති. දියඇලි රැසකින් හැඩ වී ඇති මෙම කන්ද පේද්‍රෝ කන්ද යනුවෙන් ද හැඳින්වේ.

mountainofcylone-blogspot.com

අභ්‍යාසය 01

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. ශ්‍රී ලංකාවෙහි උසම කන්ද නම් කරන්න.

    ..............................................................................

02. එහි උස මීටර් කීයද?

    ..............................................................................

03. මෙම කන්ද හඳුන්වා ඇති තවත් නමක් ලියන්න.

    ..............................................................................

ශිෂ්‍ය සටහන 02

## දුන්හිඳ දියඇල්ල

ශ්‍රී ලංකාවේ ඌව පළාතෙහි, බදුල්ල නගරයට කි.මී.5ක් පමණ දුරින් දුන්හිඳ දිය ඇල්ල පිහිටා ඇත. එහි උස මීටර් 64කි. (අඩි 210කි.) බදුල්ල නගරය හරහා ගලා බසින බදුලු ඔය මෙම මනරම් දිය ඇල්ල නිර්මාණය කරයි.

රමණීය කඳු පන්තියක් මැදින් වැටුණු අඩි පාරක කි.මී.2කට ආසන්න දුරක් පා ගමනකින් දිය ඇල්ල නැරඹීමට යා යුතු ය. පා ගමනේ දී තැනින් තැන කොන්ක්‍රීට් පඩි යොදා සැකසූ පිය ගැට පෙළ ගමනට පහසුවකි.

දුන්හිඳ දිය ඇල්ල දිය ඇලි දෙකකින් සමන්විත ය. පා ගමන අවසානයෙහි හමු වන ආරක්ෂිත වේදිකාවේ සිට ප්‍රධාන දිය ඇල්ල නැරඹිය හැකි ය. පිවිසුම් දොරටුව පසුකර කි.මී. භාගයකටත් අඩු දුරක දී අනෙක් දිය ඇල්ල මුණ ගැසේ. එය "කුඩා දුන්හිඳ" ලෙස හැඳින් වේ. දුන්හිඳ ඇල්ල පාමුල වර්ග මීටර් 100ක පමණ විශාල තටාකයක් ඇත.

අභ්‍යාසය 02

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. මෙම දියඇල්ල පිහිටා ඇත්තේ කුමන පළාතේද?

..............................................................................................

02. එහි උස මීටර් කීයද?

..............................................................................................

03. මෙම දියඇල්ල නැරඹීමට යන පා ගමන පහසු වන්නේ කුමක් නිසාද?

..............................................................................................